**2020 අංක 02 දරන විස්තර සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2020 අප්‍රේල් 24**

**කොවිඩ් -19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සහ මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම**

විවිධ මූල්‍ය ආයතන විසින් සපයනු ලබන කාලීන ණය, කල්බදු මූල්‍යකරණ පහසුකම් ආදී ණය පහසුකම් සඳහා විවිධ ණය කාණ්ඩ හෝ විවිධ වූ නම් භාවිත කරන බව නිරීක්ෂණය වූ අතර එවැනි පහසුකම් ලබාදෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් එකී පහසුකම් සඳහා සහන ලබාදීම ප්‍රතික්ෂේප කරන බවට ගනුදෙනුකරුවන්ගෙන් පැමිණිලි කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමණාකාරීත්වයට හා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද චක්‍රලේඛයන්හි ඉහතින් දැක් වූ පරිදි ආයතන විසින් ණය පහසුකම් සඳහා භාවිත කරන විවිධ නම් සඳහන් කර නොමැති බව දැනුම් දෙන අතර 2020 අංක 05 දරන චක්‍රලේඛයේ 02 වන වගන්තියේ සඳහන් අංශ සඳහා යම් ගනුදෙනුකරුවෙකු ණය පහසුකම් ලබාගෙන ඇත්නම් සහ කොවිඩ්-19 මඟින් බලපෑමට ලක්ව ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කරන්නේ නම් එම පුද්ගලයින් / ව්‍යාපාර මෙම ණය සහනය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

උදාහරණයක් ලෙස යම් ගනුදෙනුකරුවෙකු සංචාරක කර්මාන්තයට අදාල කටයුතු සඳහා ණය පහසුකම් ලබා ගෙන ඇති නමුත් එම ණය පහසුකමේ නම චක්‍රලේඛයේ සඳහන් නොමැති වුවද, ණය පහසුකම ලබාගෙන ඇත්තේ සංචාරක කර්මාන්තයට අදාල කටයුතු සඳහා සහ ඔහුගේ ආදායම දැනට පවතින තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති බව තහවුරු කර ගත හැකි නම්, ඔහු මෙම සහනය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.